## මන්ද නාව කාරණාව ...

මන්ද නාව කාරණාව
යන්න අපේ චන්දනාව
මට හරි පාළුයි ළමයෝ // //

කතරගමට ගියා තමයි
මැණික් ගඟත් හිඳිලා
කිරි වෙහෙරේ මළුව වටේ
පහන් වැටම නිමිලා //

මන්ද නාව කාරණාව ...

ඉකිබිඳ බිඳ මං ඇඬුවලු
මහ රෑ නින්දේදී
නඩේ ඇයො විහිළු කලා
වැඩිහිටි කන්දේදී //

මන්ද නාව කාරණාව ...

ලොරි බාගේ මග හිටියා
එනකොට රෑ ජාමේ
නිදි මැරුවා තැන් තැන් වල
තිස්සමහාරාමේ //

මන්ද නාව කාරණාව ...

*නන්දා මාලනී*